# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

## ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

# කල්පිටිය ධීවර වරායේ පවතින ජැටිය ප්‍රතිසංස්කරණය කිරීම

**කොන්ත්‍රාත් අංකය: CFHC/PD/REJ/KLP/2026-80**

01. **"ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව"** වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපති විසින්, යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් ඉහත සඳහන් කාර්යය සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. මෙම කාර්යයට කඩා ඉවත් කිරීමේ වැඩ, ඉවත් කිරීමේ වැඩ, කොන්ක්‍රීට් වැඩ, පෙරූඳි කදම්බ වැඩ, පිරවීමේ වැඩ ඇතුළත් වේ. ආසන්න වශයෙන් ඉංජිනේරු ඇස්තමේන්තුවේ **රුපියල් මිලියන 46.9** කි (අනිශ්චිත වියදම් සහ වැට් බදු රහිතව).

02. ලංසු තැබීම ජාතික තරඟකාරී ලංසු තැබීමේ ක්‍රමවේදය මගින් සිදු කෙරේ.

03. ලංසුකරු පහත සඳහන් සුදුසුකම් නිර්ණායකයන් සපුරාලිය යුතුය:

- සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගතව නොසිටිය යුතුය
- ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේ දී **ගොඩනැගිලි සහ පාලම් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ** C6, C5 හෝ C4 **ශ්‍රේණියේ** CIDA ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

04. ලංසුකරු පහත සුදුසුකම් නිර්ණායකයන්ට අනුකූල විය යුතුය:

- පසුගිය වසර පහ තුළ (2019, 2020, 2023, 2024, 2025) ඉටු කරන ලද ඉදිකිරීම් කාර්යයන්හි වාර්ෂික පරිමාවේ සාමාන්‍ය අවම වශයෙන් **ශ්‍රී ලංකා රුපියල් මිලියන 77** ක් විය යුතුය.
- පසුගිය වසර 5 - 10 තුළ සමාන ස්වභාවයේ සහ සංකීර්ණත්වයකින් යුත් අවම වශයෙන් එක් කොන්ත්‍රාත්තුවක් ප්‍රධාන කොන්ත්‍රාත්කරු ලෙස ඉටුකර පළපුරුද්ද තිබිය යුතුය (මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා, සඳහන් කරන ලද කාර්යයන් අවම වශයෙන් 70% ක් සම්පූර්ණ වී තිබිය යුතුය). **ශ්‍රී ලංකා රුපියල් මිලියන 36 කි.**
- ව්‍යාපෘතිය අවසන් වන දිනය දක්වා, අනෙකුත් කොන්ත්‍රාත්මය බැඳීම්වලින් සහ මෙම කොන්ත්‍රාත්තුව යටතේ සිදු කරනු ලබන අත්තිකාරම් ගෙවීම් හැර, තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් හෝ ණය පහසුකම් ප්‍රමාණය **ශ්‍රී ලංකා රුපියල් මිලියන 26** ට නොඅඩු විය යුතුය.
- රුපියල් මිලියන 5 ඉක්මවන සෑම ලංසුවක් සඳහාම, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වන වගන්තියට අනුකූලව, පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද වලංගු සහතිකයක් ලංසුකරු සතු විය යුතුය. මෙය කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා වන සුදුසුකමකි.

05. මෙම ලංසුව සඳහා ඉදිකිරීම් කාලය **දින 180** ක් වන අතර, ව්‍යාපෘතියේ ස්ථානය වන්නේ පුත්තලම් දිස්ත්‍රික්කයේ කල්පිටිය ධීවර වරාය වේ.

06. උනන්දුවක් දක්වන තනි හෝ බද්ධ ව්‍යාපාර (JV) ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු **කළමනාකරු සිවිල් ඉංජිනේරු, සිවිල් ඉංජිනේරු අංශය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15 වෙතින් 011-2527439** දුරකථන අංකය ඔස්සේ ලබා ගත හැකි අතර, ප්‍රසම්පාදන ලේඛන (නොමිලේ) **"ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ප්‍රසම්පාදන අංශය, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15"** යන කාර්යාලයෙන් පරීක්ෂා කර බැලිය හැකිය.

07. ඉංග්‍රීසි භාෂාවෙන් යුත් සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක්, උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2026.08.11 සිට 2026.09.02** දක්වා ඕනෑම වැඩ කරන දිනක පෙ.ව.9.00 සිට ප.ව. 3.00 දක්වා, **"කළමනාකරු - ප්‍රසම්පාදන, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15"** වෙත ව්‍යාපාරික ලිපි ශීර්ෂයකින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් සහ ආපසු නොගෙවන රු. 5000.00 ක ගාස්තුවක් ගෙවීමෙන් පසු මිලදී ගත හැකිය.

08. ලංසු **2026.12.03 දින දක්වා (දින 91 ක්)** වලංගු විය යුතුය.

09. සියලුම ලංසු සමග **රුපියල් හය ලක්ෂ හැත්තෑ පන් දහසක (675,000.00)** ලංසු ඇපකරයක් (බැංකු ඇපකරයක් හෝ ආපසු ගෙවිය හැකි මුදල් තැන්පතුවක්) ඉදිරිපත් කළ යුතුය. එය ලංසු විවෘත කරන දින සිට දින **119ක්** දක්වා **(2026.12.31)** වලංගු විය යුතුය. තැන්පතු ලදුපතේ පිටපතක් ලංසුව සමග අමුණා තිබිය යුතුය.

10. පිටපතක් සහිත මුද්‍රා තැබූ ලංසු **"සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ප්‍රසම්පාදන අංශය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක් හවුස් පටුමග, කොළඹ 15"** වෙත **2026.09.03 දින පෙ.ව. 11.00** ට හෝ ඊට පෙර ගෙනැවිත් භාර දිය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කෙරේ. (ලංසු විවෘත කරන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකකරුවන්ගෙන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.)

11. ලංසු පූර්ව රැස්වීම **2026.08.21 දින පෙ.ව. 11.00** ට කොළඹ 15, රොක් හවුස් පටුමග, අංක 15 හි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල ශාලාවේදී පැවැත්වේ.

12. CIDA/ SBD/02, දෙවන සංස්කරණය, ජනවාරි 2007 (පසුකාලීන ICTAD/SBD/02) ලේඛන සැලකිල්ලෙන් කියවන ලෙස සියලුම ලංසුකරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රසම්පාදන අංශය,**
**ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,**